# ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සඳහා සුදුසු ප්‍රමිති සම්පාදනය


**පාසල් පුස්තකාල කමිටු** 2016-2017 සහ 2017-18, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

**කැඳවුම්කරුවන් :**



චාන්දනී සෙනරත් මිය - **email : chan.senarath@gmail.com**

යමුනා ගීගනගේ මිය - **email: yamunaunani@gmail.com**

**උපදේශන සහාය :** උපාලි අමරසිරි මයා


**පසුබිම**

ගතවූ දශක කිහිපය තුප අප රටේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනයත් සමග පාසල් පුස්තකාලවල සැලකිය යුතු වර්ධනයක් ද අපේක්ෂා කරන ලදී. නමුත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙම වර්ධනය මෙන්ම අන්තර්ජාතික තත්වයන් සමග සසදා බලන විට ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල හා තොරතුරු සේවා තවමත් විශාල පසුගාමී තත්ත්වයක පවතින බව රහසක් නොවේ. පාසල් අධ්‍යාපනය මුළුමනින්ම පාහේ විභාග ඉලක්ක කර ගත් ක්ෂේත්‍රයක් වී ඇති අතර, එය පාසල් පෙළ පොත් සහ අදාළ විෂය නිර්දේශ සමග දැඩි ලෙස බැඳී පැවතීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව බව පෙනේ. මෙම ක්‍රියාවලියේදී පාසල් පුස්තකාල, කියවීම, තොරතුරු සාක්ෂරතා වර්ධනය වැනි අංශවලට ලැබී ඇති පහසුකම් හා ඉඩ ප්‍රස්ථා සීමිතවන අතර මේවා පිළිබඳ බලධාරීන්ගේ උනන්දුවද බෙහෙවින් සීමිත වේ.

**මූලික ප්‍රයත්නයන්**

අන්තර් ජාතික මූල්‍ය ආයතනවල ආධාර ඇතිව දියත් කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති වලදී, ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල හා තොරතුරු සේවාව සංවර්ධනය කිරීම සඳහා ප්‍රයත්න දැරීමක් පසුගිය දශක කිහිපය තුල වරින්වර දක්නට ලැබුණි. විශේෂයෙන් 1990 දශකයේ සාමාන්‍ය අධ්‍යාපනය -2 (GEP-2), ව්‍යාපෘතිය යටතේ පාසල් පුස්තකාල සහ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා පුළුල් වැඩ පිළිවෙලක් මෙන්ම ඒ සඳහා විශාල ආකාරයෙන් සම්පත් ආයෝජනයක් ද සිදුවුණි. එසේ වුවද එම පුළුල් ප්‍රයත්නය දේශීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාසල් පුස්තකාල හා තොරතුරු සේවාවට අදාළ සම්ප්‍රදායික වැට කඩොළු බිඳීමට තරම් ශක්තිමත් නොවුණි. මීට අමතරව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ පාසල් පුස්තකාල සංවර්ධනය සඳහාම ඉහත ව්‍යාපෘතිය යටතේ පිහිටවූ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS)ද, පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සාර්ථක කරලීම සඳහා දරන ලද ප්‍රයත්නයන් ගේ සාර්ථකත්වයන් ද බෙහෙවින් සීමා වී ඇත. මෙහි ප්‍රතිඵල ලෙස දැකිය හැක්කේ පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය පසුගිය දශක කිහිපය තුළ භෞතික සම්පත්, විෂය මාලා ප්‍රතිසංස්කරණ, ගුරු පුහුණුව වැනි අංශ වලින් සැලකිය යුතු වර්ධනයක් අත්පත් කරගත්ත ද, අන්තර් ජාතික තත්ත්වයන් හා සසඳා බැලීමේදී පාසල් පුස්තකාල හා තොරතුරු සේවාව තවමත් බෙහෙවින් පසුගාමී තත්වයක පවතින බව වේ.

GEP-2 ව්‍යාපෘතියේ පාසල් පුස්තකාල අනු ව්‍යාපෘතිය සමස්තයක් ලෙස අසාර්ථක වූවද, එයින් යහපත් ප්‍රතිඵල ගනනාවක් ලැබූ බව ද මෙහිදී අමතක නොකළ යුතු වේ. NILIS ආයතනය පිහිටුවීම නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල ක්ෂේත්‍රය ලැබූ උසස්ම ජයග්‍රහණයකි. පාසල්/ගුරු පුස්තකාලයාධිපතීන් ඉලක්ක කර ගත්, අන්තර්ජාතික විශේෂඥයින්ගේ සහායයෙන් සැලසුම් කරන ලද විෂය නිර්දේශ සහිත අන්තර් ජාතික මට්ටමේ පාඨමාලා ගනනාවක් ද, ගුරුවරුන්, විදුහල්පතීන්, අධ්‍යාපන බලධාරීන් ඉලක්ක කරගත් පාඨමාලා ගනනාවක් ද මෙම ආයතනය මඟින් සාර්ථකව දියත් කරන ලදී. ‘‘සවිබලකරණය-8’’ තොරතුරු සාක්ෂරතා ආදර්ශය, දේශීය වශයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද අගය කරනු ලබන  වැඩසටහනකි. පාසල්/ගුරු පුස්තකාලයාධිපතීන්ට උසස් වෘත්තීය පුහුණු පාඨමාලා, අදාළ ප්‍රමිතිවලට අනුව සැලසුම් කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් සිදු කළේ NILIS ආයතනයි. ඒ මගින් රටේ සමස්ත පාසල් පුස්තකාල සේවාවේම විප්ලවීය වෙනසක් සිදු කිරීම අරඹන ලදී. අධ්‍යාපන බලධාරීන් මෙයට සහායවී, ගුරු පුස්තකාලයාධිපති සේවාව, අදාළ විශේෂඥ නිර්දේශ අනුව නිවැරදි ලෙස ස්ථාපනය කළා නම්, මේ වන විට ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල සේවාව දකුණු ආසියාවේ හොඳම පාසල් පුස්තකාල සේවාව වීමට බෙහෙවින් ඉඩ කඩ තිබුණි. එම මහඟු ඓතිහාසික අවස්ථාව ගිලිහී යාම ජාතියේ අවාසනාවකි.

NILIS ආයතනය පිහිටුවීම අවශ්‍ය පදනම දැමීම සහිත මෙම මහා ව්‍යාපෘතිය ඇරඹීමට අධ්‍යාපන අමාත්‍යාංශයට උරදෙනු ලැබුවේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වේ. පසුව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය මෙම ව්‍යාපෘතිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණය කරන ලදී. මෙම ආයතන තුනේ ප්‍රයත්නය නිසා  රටපුරා සිය ගණනක් නව පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන (School Library and Learning Resource Centres) බිහිවීමත්, පළාත් හා දිස්ත්‍රික් මට්ටම්වලින්  පාසල් පුස්තකාල පරිපාලන ව්‍යුහයක් ගොඩ නැගීමත්, ගුරු පුස්තකාලයාධිපතීන් ලෙස බඳවා ගත් සිය දහස් ගනනක් විවිධ මට්ටමේ පාසල් පුස්තකාල පාඨමාලාවලට සහභාගීවීමත්, දිවයින පුරා පාඨමාලා සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීමත් සිදු විය. NILIS ආයතනයේ ප්‍රධාන පුහුණු කරුවන්ට අමතරව, දිවයින පුරා විසිරුණු දේශීය හා විදේශීය පුහුණුව ලැබූ පුහුණුකරුවන් සංචිතයක් බිහිවීමද මෙම ව්‍යාපෘතියේ තවත් යහපත් ප්‍රතිඵලයක් විය. එසේම ගුරු විද්‍යාල 2ක, පුස්තකාල විද්‍යා පාඨමාලා ස්ථාපිත කරන ලදී.

**පාසල් පුස්තකාල ප්‍රමිති - අන්තර් ජාතික තත්ත්වය**

අන්තර් ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) දැනට වසර කිහිපයකට පෙර IFLA School Library Guidelines ප්‍රකාශයට පත් කරන ලදී.  අන්තර් ජාතික පාසල් පුස්තකාල සංගමය (IASL), මෙම විෂයට අදාළ ප්‍රකාශන ගණනාවක් පළ කර ඇත.  යුරෝපීය රටවල් මෙන්ම ඔස්ට්‍රේලියාව, නවසීලන්තය සහ ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවල් සාමාන්‍ය අධ්‍යාපනයේ දී පාසල් පුස්තකාලවල කාර්ය පිළිබඳ  විවිධ ප්‍රකාශන, ප්‍රමිතීන් රැසක්

ප්‍රකාශයට පත් කර ඇත. එක්සත් රාජධානියේ පාසල් පුස්තකාල සංගමය "SLA Standards for Secondery School Libraries" 2015 එළි දක්වා ඇත. 2010 ප්‍රකාශිත "Model School Library Standards for California Public Schools" නවීන පාසල් පුස්තකාල ප්‍රමිතිවලට තවත් නිදසුනකි. 2017 වර්ෂයේ ඔක්තෝම්බර් මස ඇමරිකා එක්සත් ජනපදයේ පාසල් පුස්තකාල සංගමය (ALA) විසින් එළි දැක්වූ "National School Library Standards for Learners, School Librarians and School Libraries" මෙහි නවතම ප්‍රකාශනය ලෙස සැලකිය හැකි ය. මෙම සියළු ප්‍රයත්නවල පොදු පරමාර්ථය වන්නේ 21වන සියවසේ සුවිශේෂ අධ්‍යාපන අවශ්‍යතා මෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නව ප්‍රවනතා සැලකිල්ලට ගනිමින් පාසල් පුස්තකාලවලින් අපේක්ෂිත කාර්ය භාරය පැහැදිලි කරලීම වේ.

**පාසල් පුස්තකාල ප්‍රමිති - දේශීය තත්ත්වය**

අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධනය අංශය මගින් දැනට වසර 15කට පමණ පෙර GEP-2 ව්‍යාපෘතිය යටතේ ප්‍රකාශිත "පාසල් පුස්තකාල සහ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සඳහා උපදෙස් සංග්‍රහය" මෙම ක්ෂේත්‍රයේ පලවූ වැදගත් ප්‍රකාශනයක් ලෙස සැලකිය හැකිය. එය සෘජුවම පාසල් පුස්තකාල සහ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන ප්‍රමිති මාලාවක් ලෙස වර්ග කිරීම අපහසු වුවද, පාසල් පුස්තකාලයක තිබිය යුතු අංශ සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ පුළුල් විස්තරයක් මෙහි ඇතුලත් කොට ඇත.

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය මෙම ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශන ගණනාවක් ප්‍රකාශයට පත්කර තිබේ. 2004 වර්ෂයේ එම ආයතනය විසින් හඳුන්වා දුන් "සවිබලකරණය 8" (Empowering 08) තොරතුරු සාක්ෂරතා ආදර්ශය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් පුස්තකාල ව්‍යවහාර සඳහා පුළුල් ලෙස පසුගිය කාලය තුල යොදා ගන්නා ලදී. එසේම NILIS ආයතනයේ පාඨමාලාවල විෂය නිර්දේශ උසස් මට්ටමේ පාසල් පුස්තකාල සේවාවලට අදාළ කරුණුවලින් පිරී තිබුණි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 1990 දශකයේදි ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල සඳහා මූලික මට්ටමේ ප්‍රමිති මාලාවක් හඳුන්වා දෙන ලදී. පළමු, දෙවන සහ තෙවන ශ්‍රේණිවල පාසල් පුස්තකාලවල තිබිය යුතු අවම ප්‍රමිතීන් ඒ මගින් දක්වා ඇත.

**වර්තමාන ප්‍රයත්නය**

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සඳහා නිශ්චිත ප්‍රමිතීන් හඳුන්වා දීම පවතින සුවිශේෂ තත්ත්වයන් යටතේ විශාල අභියෝගයක් බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. GEP 2 පාසල් පුස්තකාල ව්‍යාපෘතියේ අසාර්ථකත්වයෙන් පසු පාසල් පුස්තකාල සහ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන පිළිබද හෝ ඒ ක්ෂේත්‍රයේ නව ප්‍රතිපත්ති හෝ අනාගත සැලසුම් පිළිබඳ කිසිදු නිල ප්‍රකාශනයක් අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපත් කොට නොමැත. අවම වශයෙන් උක්ත ව්‍යාපෘතිය අසාර්ථකවීමට බලපෑ හේතු සාධක පිළිබඳව පසුවිපරමක් හෝ කර නොතිබුණි.

මෙම අංශවල කටයුතු සම්බන්ධීකරනය කරනු ලබන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය දැනට දශක කිහිපයක් පැරණි සිය පාසල් පුස්තකාල ප්‍රමිතීන් යාවත්කාලින

කිරීමේ ව්‍යාපෘතියක් ද අරඹා නොමැත. පාසල් පුස්තකාල ඇතුලු පළාතේ සියළුම පුස්තකාල පිළිබද අධීක්ෂණ හා උපදේශන කටයුතු කරන පළාත් පුස්තකාල සේවා මණ්ඩල 4 ක්, පළාත් හතරක දැනට පිහිටුවා ඇත. මෙම මණ්ඩල ද තවමත් ළදරු වියේ පසුවන නිසාදෝ තම පළාත්වලට අදාළ පාසල් පුස්තකාල සදහා ප්‍රමිති සම්පාදනයක් පිළිබද මෙතෙක් අවධානය යොමු කර නොමැත. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයද, එහි වර්තමාන උපාය මාර්ගික සැලැස්ම දියත් කිරීමට පෙර සීමිත ක්ෂේත්‍රයක කටයුතු කිරීමක් දක්නට ලැබුණු අතර පුස්තකාල ප්‍රමිති සම්පාදනය පිළිබඳ කිසිදු අවධානයක් යොමු කර නොතිබුණි.

### අපගේ ඉලක්කයන් හා දර්ශනය

අප කමිටුවේ වර්තමාන ඉලක්කය ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන වල පැවතිය යුතු යයි අප අදහස් කරන ප්‍රධාන ලක්ෂණ හා පහසුකම් හදුනා ගැනීමත්, අන්තර්ජාතික ප්‍රමිතීන් හා නව ප්‍රවණතා අනුව ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල තුල එම පහසුකම් අඩුවැඩි වශයෙන් පැවතිය යුතු ආකාරය පිළිබද අපගේ ප්‍රමිතීන් ඉදිරිපත් කිරීමත් වේ.

### ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිති

මෙම ප්‍රමිතීන් සම්පාදනයේදී හැකිතාක් දුරට අපගේ මව් සංවිධානය වන IFLA සංවිධානය විසින් යෝජිත ප්‍රමිතීන් අනුගමනය කිරීමට ප්‍රයත්න දරන ලදී. IFLA ප්‍රමිතීන්වල මූලික අරමුණ ශ්‍රී ලංකාව වැනි එහි සාමාජික රටවලට මඟ පෙන්වීම බැවින්ද, එම ප්‍රමිතීන් සියලුම රටවලට පාහේ ගැලපෙන ලෙස, විශේෂඥ කමිටු මඟින්, දීර්ඝ ක්‍රියාවලියකින් පසු සකස් කර ඇති බැවින් ද ඒවා හැකිතාක් දුරට අනුගමනය කිරීම අපගේ වගකීමක් වේ. මීට අමතරව ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ පසුගිය දශක දෙකක පමණ අත්දැකීම්ද, සාර්ථක පාසල් පුස්තකාල සේවා පවතින රටවල් කිහිපයක පාසල් පුස්තකාල ප්‍රමිතීන්ද මෙහිදී උපයෝගී කර ගන්නා ලදී.

### 1. පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයේ අරමුණු

- ශිෂ්‍යයන්ට අවශ්‍ය තොරතුරු සහ නව දැනුම ලබාදීම.
- ඔවුන්ගේ තර්කානුකුල චින්තනයට අනුබල දීම.
- තොරතුරු සම්පත් පරිහරණය කරලීමට මග පෙන්වීම.
- පුස්තකාලයෙන් බාහිර දුරස්ථව ඇති සම්පත් හදුන්වා දීම.
- පෙළ පොත්වල ඇති විෂයයනට අතිරේක දැනුම ලබාදීම.
- තොරතුරු සාක්ෂරතාව වර්ධනය සඳහා අවශ්‍ය දැනුම සහ හැකියාවන් වර්ධනය කරලීම.
- තොරතුරු ලබාගැනීම, ලබාගත් තොරතුරු ඇගයීම සහ නිවැරදි තොරතුරු සාර්ථකව භාවිත කිරීමේ හැකියාව වර්ධනය කිරීම.

- තොරතුරු සාක්ෂරතා හැකියාවන් තම අධ්‍යයන හා ඉගෙනුම් කටයුතු සඳහා යොදා ගැනීමට ශිෂ්‍යයන්ට මඟපෙන්වීම.

## 2. පාසල් පුස්තකාල ගොඩනැගිල්ල හෝ පුස්තකාල අවකාශය (Library Space)

විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින ප්‍රධාන පාසල් සඳහා වෙනම පුස්තකාල ගොඩනැල්ලක් තිබීම වැදගත් වේ. අනෙකුත් පාසල් සඳහා වුවද වෙනම පුස්තකාල ගොඩනැල්ලක් තිබීම ප්‍රයෝජනවත් වුවද එය අත්‍යාවශ්‍ය අංගයක් නොවේ. විදුහලේ පන්ති කාමරයක් හෝ වෙනත් සුදුසු ස්ථානයක පාසල් පුස්තකාලය පවත්වා ගෙන යෑම මැනවි. පාසල් පුස්තකාල ගොඩනැල්ල ඉදි කිරීමේදී හෝ පාසල් පුස්තකාලය සඳහා ස්ථානයක් තෝරා ගැනීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු බව අන්තර් ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) නියමුවල දක්වා ඇත. ඒවා ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලවලටද අදාළ වේ.

- පාසලේ මධ්‍ය ස්ථානයක් වීම
- පන්ති කාමරවල සිට පහසුවෙන් ළගා වීමට හැකිබව
- ශබ්ද හා ඝෝෂාකාරී බව අවම වීම
- අවශ්‍ය පමණට ආලෝකය තිබීම
- සුදුසු පරිසරය සහ මනා වාතාශ්‍රය

මෙයට අමතරව පළමු ශ්‍රේණියේ පුස්තකාලයක් නම් එය අවම වශයෙන් වර්ග අඩි 3000 ක බිම් ප්‍රමාණයක් සමන්විතවීම නිර්දේශ කරමු. මෙම ඉඩ ප්‍රමාණය දෙවන හා තුන්වන ශ්‍රේණිවල පුස්තකාල සඳහා පිළිවෙලින් වර්ග අඩි 1500 සහ 1000 ලෙස නිර්දේශ කෙරේ.

## 3. පුස්තකාලයේ අභ්‍යන්තර සැලැස්ම

ඉහත සඳහන් IFLA නියමුවේ පාසල් පුස්තකාල අවකාශය පහත සඳහන් කාර්යයන් සඳහා යොදා ගත යුතු බව දක්වා ඇත.

- අධ්‍යයන සහ පර්යේෂණ ප්‍රදේශය
- සාමාන්‍ය කියවීම් ප්‍රදේශය
- කුඩා කණ්ඩායම් සඳහා උපදේශන සේවා ප්‍රදේශය
- මාධ්‍ය නිර්මාණ ප්‍රදේශය
- පරිපාලන ප්‍රදේශය

මෙම නිර්දේශ පොදු වශයෙන් සියලු දෙනාට පිළිගත හැකි බැවින් අවශ්‍ය යම් යම් වෙනස්කම් සහිතව ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල සඳහා ද නිර්දේශ කෙරේ. මෙහිදී වඩාත්

වැදගත් වන්නේ ඉහත අවශ්‍යතා අනුව මෙන්ම, පුස්තකාලයේ පරමාර්ථ වලට ගැලපෙන ලෙස පවතින අවකාශය විද්‍යානුකූලව මෙන්ම නිර්මාණශීලී ලෙස භාවිත කිරීම වේ.

නවීන සාර්ථක පාසල් පුස්තකාලයක් යනු පාසලේ ශිෂ්‍ය ප්‍රජාවගේ දැනුම හා තොරතුරු සාක්ෂරතා වර්ධනය සඳහා බහු විධ ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලබන ස්ථානයක් බව අවබෝධ කර ගැනීම මෙහි දී ඉතා වැදගත් වේ. සම්ප්‍රදායානුකූල පුස්තකාලයක පැවැති නිශ්ශබ්ද කියවීම සඳහා පාසල් පුස්තකාලයේ එක් කොටසක් වෙන් කරලීම ප්‍රමාණවත් වේ. ඉතිරි ඉඩ ප්‍රමාණය විවිධ ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීම අවශ්‍යවේ. ඒ ඒ කණ්ඩායම්වල සහ වැඩසටහන්වල අවශ්‍යතා අනුව පුස්තකාලයේ ඉඩකඩ ලබා ගැනීම සඳහා පහසුවෙන් එහා මෙහා කළ හැකි පුස්තකාල ලී බඩු, උපකරණ වැදගත් වේ. සැහැල්ලු මේස, පුටු, කුඩා රෝද සවිකරණ ලද පොත් රාක්ක පාසල් පුස්තකාල අභ්‍යන්තර සැලසුම් සැකසීමේදී සැලකිල්ලට ගැනීම විශේෂයෙන් නිර්දේශ කෙරේ.

එක් පන්තියක සියලුම සිසුන් සහභාගී වන වැඩ සටහනක් පැවැත්වීමට පුස්තකාලයේ ඉඩකඩ ප්‍රමාණවත් විය යුතුවේ. අදාළ විෂය භාර ගුරුවරුන්ට තම පන්තියේ සියලුම සිසුන් සමඟ පුස්තකාලයට පැමිණ අදාළ ක්‍රියාකාරකම්වල යෙදීම දිරිමත් කරලීම වැදගත් වන බැවින් ඒ සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් පුස්තකාලයේ තිබිය යුතු වේ.

මීට අමතරව පොත් එකතුව තැන්පත් කර තැබීම, අලුත් පොත් ප්‍රදර්ශනය, කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය ඉඩකඩ, තොරතුරු තාක්ෂණ ද්‍රව්‍ය සහ මාධ්‍ය පරිහරණය සඳහා අවශ්‍ය ඉඩකඩ ද මෙහි දී සැලකිල්ලට ගත යුතු වේ.

## 4. පුස්තකාල සම්පත් සංවර්ධනය හා සංවිධානය

පාසලේ සහ පාසල් පුස්තකාලයේ අවශ්‍යතාවලට ගැලපෙන උසස් මට්ටමේ පුස්තකාල සම්පත් එකතුවක් පවත්වා ගෙන යාම අතිශයින් වැදගත් වේ. පාසල් පුස්තකාල සම්පත්වල ආකර්ශනියත්වය සහ ගුණාත්මක බව පාසල් පුස්තකාලය වෙත ශිෂ්‍යයන් ආකර්ශනය කරන ප්‍රධාන සාධකය වේ. මේ සඳහා විද්‍යාත්මකව සකස් කරන ලද ''පාසල් පුස්තකාල එකතු සංවර්ධනය සහ කළමණාකරණ ප්‍රතිපත්ති'' අදාළ බලධාරින් විසින් සකස් කොට ප්‍රකාශයට පත් කළ යුතු වේ. ජාතික තලයේ මෙන්ම පළාත් පුස්තකාල බලධාරින් ද මෙම කාර්යයට උරදීම වැදගත් වේ.

අතීතයේදි ඒ ඒ ශ්‍රේණිවල පාසල් පුස්තකාලවල තිබිය යුතු අවම පාසල් පුස්තකාල සම්පත් ප්‍රමාණය සංඛ්‍යාත්මකව දැක්වුවද නව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමග එය තව දුරටත් නොගැලපෙන බව පෙනේ. ක්‍රමක්‍රමයෙන් පාසල් ශිෂ්‍යයන් ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා අන්තර් ජාලය ඔස්සේ සපුරා ගැනීම සිදු කර ගනු ලැබීම ලොව පුරා දක්නට ලැබෙන ප්‍රවනතාවයක් වේ. ශ්‍රී ලංකාවේ ද මෙම ප්‍රවනතාවය විශේෂයෙන් නාගරික ප්‍රදේශවල ද යම් තරමකට ගම්බද ප්‍රදේශවලද දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලයක තිබිය යුතු ප්‍රධාන පුස්තකාල ද්‍රව්‍ය හඳුනා ගැනීම හා නිර්දේශ කිරීම වැදගත් වේ. මෙහිදී ''සම්පත්'' ලෙස හඳුන් වනුයේ පොත්පත්, වාරසඟරා වැනි මුද්‍රිත මාධ්‍ය මෙන්ම, ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය, ඩිජිටල් මාධ්‍ය ඇතුලු සියලු වර්ගයේ සම්පත් වේ.

ඒ අනුව

- පාසලේ විෂය නිර්දේශයට අදාළ සම්පත්
- විනෝදාස්වාදය සඳහා වූ සම්පත්
- මූලික විමර්ශන සම්පත්
- විශේෂ එකතු
- පුවත්පත්, වර සඟරා විශේෂයෙන් දැක්විය හැක.

මීට අමතරව සයිබර් අවකාශය තුළින් අන්තර්ජාලය ඔස්සේ අවශ්‍ය තොරතුරු සොයා ගැනීම සහ ලබා ගැනීමට පාසල් පුස්තකාලයේ පහසුකම් පැවැතිය යුතුය. පුස්තකාල සම්පත්වලින් 20% ක ප්‍රමාණයක් පසුගිය වසර දහය තුළ ප්‍රකාශිත ඒවා විය යුතුවේ. පුස්තකාල සම්පත්වල කාලීන බව රැක ගැනීමට මෙම ප්‍රමිතිය වැදගත් වේ.

වෘත්තීය පුස්තකාලයාධිපතින් සේවය කරන අධ්‍යයන, විශේෂ වැනි වෙනත් පුස්තකාල ක්ෂේත්‍රවල පුස්තකාල සම්පත් විද්‍යානුකූලව සංවිධානය කරලිම අත්‍යාවශ්‍ය වුවද, පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ මෙම තත්ත්වය තරමක් වෙනස් වේ. දැනට ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලවල වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් ඉතා සීමිතව සේවය කරනු ලබයි. ඇතැම් ගුරු පුස්තකාලයාධිපතිවරුන් පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තීය පුහුණුවක් ලැබුවද, ඔවුන් පුස්තකාලයාධිපතිවරුන් සහ ගුරුවරුන් ලෙස ද්විත්ව භූමිකාවක් නිරූපනය කරන බැවින් යම් ආකාරයක සීමාවන්ට යටත්ව තම රාජකාරිය සිදු කරන ලබයි.

ඇතැම් ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට කිසිඳු වෘත්තීය පුහුණුවක් නොමැති බව ද මෙහිදී සැලකිල්ලට ගත යුතු වේ. මේ නිසා පාසල් පුස්තකාල සම්පත් සංවිධානයේදී අවම මූලික ප්‍රමිතින් යොදා ගැනිම වඩාත් ගැලපේ. ඒ අනුව පුස්තකාල සම්පත් නියමිත ලෙස ප්‍රතිග්‍රහණය කරලීම, වර්ගීකරණය, මූලික මට්ටමේ සූචිකරණය සහ ආකර්ශණීය ලෙස සංවිධානය කර තිබීම අවම ප්‍රමිතීන් ලෙස දැක්විය හැක.

## 5. ප්‍රධාන සේවාවන්

සම්ප්‍රදායානුකූල විමර්ශන හා බැහැරදීම් සේවා තවදුරටත් පාසල් පුස්තකාලයක වැදගත් කාර්යයන් වේ. වර්තමානයේ පාසල් පුස්තකාලයක වඩාත් වැදගත් සේවා ලෙස තොරතුරු සාක්ෂරතාවය වර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා වර්ධනය හඳුනා ගෙන ඇත.

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍ය ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන බලධාරින් සමග එක්ව දැනට පාසල් ගුරුවරුන් හා පුස්තකාලයාධිපතීන් සඳහා උසස් මට්ටමේ තොරතුරු සාක්ෂරතා වැඩ සටහන් මෙහෙයවනු ලැබේ. මෙම පාඨමාලාවලට සහභාගි වීමෙන් පුස්තකාලයාධිපතිවරුන් මෙම අංශයේ තම කුසලතා වර්ධනය කර ගැනීම නිර්දේශ කෙරේ. මෙම ආයතන තම පාඨමාලා, විෂය නිර්දේශ, වැඩසටහන් කාලානුරූපව නවීකරණය කර ගත යුතු වේ.

21වන සියවසේ පාසල් සිසුන් තම තොරතුරු අවශ්‍යතා හා දැනුම ලබා ගැනීම සඳහා අන්තර්ජාලය වෙත සීඝ්‍රයෙන් යොමු වෙමින් සිටිති. බොහෝ පාසල්වල තොරතුරු තාක්ෂණ අංශ පිහිටුවා ඇති අතර පාසල් සිසුන්ට පරිගණක ටැබ් ලබා දීමේ ව්‍යාපෘතියක් සැලසුම් කර ඇත. මීට අතරව බොහෝ ශිෂ්‍යයින් දැනටමත්, පරිගණක, ස්මාර්ට් මොබයිල් දුරකථන (Smart Mobile Phone) මගින් තොරතුරු සොයා ගැනීමට පුරුදු වී සිටිති. පාසල් පුස්තකාලයාධිපති වරයා මෙම කාර්යයේදී දායක විය යුතුවේ. මෙහිදී පාසල් පුස්තකාලය, පාසලේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සමග එකතුවී සිසුන්ගේ අන්තර්ජාල ගවේෂණ කුසලතා සහ තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනයට පොදු වැඩ සටහන් දියත් කිරිම නිර්දේශ කෙරේ. සිසුන්ගේ දැනුම් ගවේෂණය හා තොරතුරු සාක්ෂරතාවය වර්ධනය කිරීමට කැපවූ පාසල් පුස්තකාලය හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය වෙන් කර තැබීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන බලධාරීන් අතින් සිදුවූ වරදකි. එය ඉක්මනින් නිවැරදි කළ යුතුවේ. දැනටමත් මෙම තොරතුරු තාක්ෂණ අංශවල සේවය කරන අයගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් GEP -2 ව්‍යාපෘතිය යටතේ පුස්තකාල විද්‍යා පුහුණුවක් ලැබූ අය නිසා මෙම දෙපාර්ශවය සම්බන්ධ කිරීම අපහසු නොවේ.

සම්ප්‍රදායානුකූල පාසල් පුස්තකාල ක්‍රියාවලියෙන් බැහැර ව සිසුන් අමතර ක්‍රියාකාරකම් මගින් පුස්තකාලය වෙත ආකර්ශනීය කර ගැනීමට පුස්තකාලයාධිපති වරයා සමත් විය යුතුය.

- ප්‍රදර්ශන
- පුස්තකාල ආශිතව කෙරෙන ක්‍රියාකාරකම්
- සම්මන්ත්‍රණ හා වැඩමුළු
- තරඟ (අත් අකුරු , දැනුම මිනුම, වැඩිම පොත් කියවීම, අන්තර්ජාලයේ තොරතුරු සෙවීම්)
- දේශන හා
- පරිසර අධ්‍යයන චාරිකා නිදසුන් ලෙස දැක්විය හැක.

## 6. පුස්තකාල කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ සම්පත් වර්තමානයේ පවත්නා ගැටළුකාරී, අවිනිශ්චිත තත්වය මත පාසල් පුස්තකාල හා ඉගෙනුම් මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමිති නිර්දේශ කිරිම අපහසුවේ. වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් සහිත ප්‍රධාන වශයෙන් ගුරු පුස්තකාලයාධිපතිගෙන් සමන්විත පාසල් පුස්තකාල සේවාවක් නිර්මාණය කරලිම සඳහා GEP 2 ව්‍යාපෘතිය යටතේ කරන ලද ප්‍රයත්නය අසාර්ථක වීම නිසා මෙම තත්ත්වය උදාවී ඇත.

දැනට ඇතැම් පාසල්වල වෘත්තීය පුස්තකාලයාධිපතිවරුන් සේවය කරන අතර ඇතැම් ඒවායේ පුහුණු ගුරු පුස්තකාලයාධිපතින් සේවය කරනු ලබයි. සේවා ස්ථිරත්වය හා සේවා උසස්වීම් පිළිබද ප්‍රතිපත්තියක් සම්පාදනය නොවිම නිසා ජාතික පුස්තකාල හා විඥාපන

විද්‍යා ආයතනයේ සහ ගුරු විද්‍යාලවල පුහුණු වූ ගුරු පුස්තකාලයාධිපතීන් ගුරු වෘත්තියට, පාසල්වල තොරතුරු තාක්ෂණ අංශයට හෝ වෙනත් අංශවලට යොමු වීමක් දක්නට ලැබුණි. මේ නිසා පාසල් පුස්තකාල බහුතරයක් නුපුහුණු හෝ සීමිත පුහුණුවක් ලැබූ ගුරු පුස්තකාලයාධිපතින් හෝ නුපුහුණු පුස්තකාල භාරකරුවන් යටතේ ක්‍රියාත්මක වේ.

සෑම පාසල් පුස්තකාලයක් සඳහාම වෘත්තීය පුස්තකාලයාධිපතිවරයෙකු හෝ වෘත්තීය ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු පත් කිරීම නිර්දේශ කෙරේ. පාසල් පුස්තකාලවලට අවශ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කරන පුහුණු මධ්‍යස්ථානය ලෙස NILIS ආයතනයේ තත්වය ස්ථාවර කළ යුතුවේ. අධ්‍යාපන අමාත්‍යාංශය තම "ළඟම පාසල, හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ කඩිනම් පාසල් පුස්තකාල සංවර්ධන වැඩපිළිවෙලක් නොපමාව දියත් කළ යුතු වේ. එබඳු වැඩපිළිවෙලක දී NILIS ආයතනයට නිසි පිළිගැනීම සහ අදාළ පුහුණු වගකීම් පවරා දීම සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය පදනමක් වේ. පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ අන්තර්ජාතික මට්ටමේ පුහුණු ආයතනයක් පිහිටුවා, පසුව එය නොසලකා හැරීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන බලධාරීන් අතින් සිදුවූ ඓතිහාසික වරදක් ලෙස සැලකිය හැක. දශක 2 කට පසුව හෝ එම වරද නිවැරදි කර ගැනීමට බලධාරීන් කටයුතු කළ යුතුවේ.

NILIS ආයතනයේ, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හා කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා අංශයේ අනුග්‍රහයෙන් ශ්‍රී ලංකාවේ සියලුම පාසල් හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානවලට අවශ්‍ය පුහුණු කාර්ය මණ්ඩලය ක්‍රමානුකූලව වර්ධනය කර ගැනීමේ සැලැස්මක් අධ්‍යාපන බලධාරීන් විසින් නොපමාව සකස් කළ යුතුවේ.

එබඳු පසුබිමක් යටතේ ශිෂ්‍යයින් 1000කට අධික පිරිසක් සිටින පාසල්වල පුස්තකාල සඳහා

- පුහුණු පුස්තකාලයාධිපතිවරු 2
- පුහුණු පුස්තකාල සහකාරවරු 1

ශිෂ්‍යයින් 1000කට අඩු පාසල්වල පුස්තකාල සඳහා

- පුහුණු පුස්තාකාලයාධිපති 1
- පුහුණු පුස්තකාල සහකාර 1 සේවයේ යොදවා ගැනීම නිර්දේශ කෙරේ. මෙම පුස්තකාලයාධිපතීන් රජයේ ප්‍රතිපත්ති අනුව වෘත්තීය පුස්තකාලයාධිපතිවරු හෝ ගුරු පුස්තකාලයාධිපතිවරුන් හෝ මෙම දෙවර්ගයේ සම්මිශ්‍රණයක් විය හැක. වැදගත් වනුයේ සෑම පාසල් පුස්කාලයක් සඳහාම වෘත්තීය පුහුණුව ලැබූ පුස්තකාලයාධිපතිවරයෙකු සිටීම වේ.

## 7. වාර්ෂික මුදල් ප්‍රතිපාදන

උසස් පෙළ දක්වා පංති ඇති පුස්තකාලයක එක් පාසල් ශිෂ්‍යයකු සඳහා රුපියල් 500.00 මුදලක්ද පළමු හා දෙවන ශ්‍රේණියේ පුස්තකාල එක් පාසල් ශිෂ්‍යයකු සඳහා රුපියල් 300.00 මුදලක් ද වෙන් කිරීම නිර්දේශ කෙරේ.

## 8. පුස්තකාලය විවෘතව තැබීම

පාසල් ශිෂ්‍යයින්ට සහ ගුරුභවතුන්ට පාසල් ආරම්භ කිරීමට පෙර, පාසල් කාලය තුළ හා පාසල අවසන්වූ පසු නිදහසේ පුස්තකාලය භාවිතා කිරීම සඳහා පෙ.ව. 7.00 සිට ප.ව.3.30 දක්වා දිනකට පැය 8ක් සතියේ දින 05 තුල විවෘතව තැබිය යුතුය.

**9. පුස්තකාල අධීක්ෂණ කමිටුව:**

පාසල් පුස්තකාලයේ ක්‍රමානුකූල සංවර්ධනය සඳහා පාසල් මට්ටමෙන් අධීක්ෂණ කමිටුවක් පවත්වාගෙනයාම වැදගත් වේ. විදුහල්පතිවරයාගේ නායකත්වයෙන්, පාසලේ සියලුම විෂය අංශ භාර ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගෙන් සමන්විත මෙම අධීක්ෂණ කමිටුවේ ලේකම් ලෙස පුස්තකාලයාධිපතිවරයා කටයුතු කළ යුතු වේ. පාසලේ ආචාර්ය මණ්ඩලය, විෂය නිර්දේශ අවශ්‍යතා හා අනෙකුත් අධ්‍යයන කටයුතු සමඟ පුස්තකාලයේ කටයුතු සම්බන්ධිකරණයට සහායවීම සහ මඟ පෙන්වීම මෙම අධීක්ෂණ කමිටුවේ කාර්යභාරය වේ.

**10. සම්පත් බෙදාහදා ගැනීම:**

පාසල ආසන්නයේ ඇති මහජන පුස්තකාල හෝ වෙනත් සුදුසු පුස්තකාල සමඟ අදාළ පුස්තකාලවල සම්පත් බෙදාහදා ගැනීම පාසල් පුස්තකාලයටත් අනෙකුත් සියලුම පර්ශවවලට ප්‍රයෝජනවත් වේ. පළාත් පුස්තකාල මණ්ඩල සහ පළාත් මධ්‍ය පුස්තකාල පාසල් පුස්තකාල සඳහා අමතර සම්පත් සපයන්නන් ලෙසත්, මෙබඳු සහයෝගිතා වැඩ පිළිවෙලවල් සම්බන්ධිකරණය කරන ආයතන ලෙසත් කටයුතු කරනු ඇත.

**11. සමාප්තිය**

පාසල් පුස්තකාල සඳහා යෝජිත මෙම ප්‍රමිතීන්, ඉදිරියේදී වඩාත් විද්‍යානුකූලව සකස් කෙරෙන ප්‍රමිති මාලාවකට පදනම වනු ඇතැයි අපගේ විශ්වාසය වේ. මෙහි ප්‍රධාන පරමාර්ථය දැනට තරමක අවුල් සහගත තත්වයක ඇති ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල සේවාවට යම් උත්තේජනයක් සහ මඟ පෙන්වීමක් ලබාදීම වේ. මෙහි දී ආදර්ශය ලෙස අප යොදා ගනු ලැබුවේ ඉෆ්ලා පාසල් පුස්තකාල මාර්ගෝපදේශ වේ. එම වටිනා ප්‍රකාශණය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මෙම ව්‍යාපෘතිය යටතේම සිංහල, දෙමළ භාෂාවලට පරිවර්තනය කර තිබීම මෙහිදී විශාල පහසුවක් වේ. පාසල් පුස්තකාල 21 වන සියවසට ගැලපෙන ලෙස සංවිධානය විය යුතු ආකාරය පිළිබඳව එහි මනාව පැහැදිලි කර ඇත.

ශ්‍රී ලංකාවේ පාසල් දරුවන්ටද තම දැනුම හා තොරතුරු සාක්ෂරතාවය වර්ධනයට, ලොව ප්‍රබලම සහ ඉහළම සංවර්ධන තත්වයන් ඇති රටවල දරුවන්ට හා සමාන අවස්ථා ලබා දිය යුතු බව අප තරයේ විශ්වාස කරමු. ඒ සඳහා උසස්, ශක්තිමත් පාසල් පුස්තකාල හා ඉගෙනුම සම්පත් මධ්‍යස්ථාන ජාලයක්, ශ්‍රී ලංකාවේ සියලුම පාසල් සමඟ ඒකාබද්ධව පැවැතිය යුතු බවත්, එම තත්වය ළඟා කර ගැනීමට ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ මධ්‍යම රජයේ සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සැලැසුම් සහගත, ඒකබද්ධ ප්‍රයත්නයක් දැරිය යුතු බවත් මෙහිදී වැඩි දුරටත් අවධාරනය කරමු.

(මෙම ප්‍රමිතිවල මූලික පිටපතට ලැබෙන ප්‍රතිචාර අනුව ඉදිරියේදී මෙය තව දුරටත් සංශෝධනය කිරීමට අපේක්ෂා කෙරේ.)

.

----------